VERITÉ RESEARCH

NO. 5 POLICE PARK PLACE, COLOMBO 00500, SRI LANKA
TEL: + 94 718 834945; FAX: +94 719379567
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

# ගෝලීය මහා වෙළඳ සාප්පය තම ගෙවත්තෙහිම සමරද්දී ශ්‍රී ලංකාව හුදෙකලා වේ

කලකට පෙර ශ්‍රී ලංකාව දකුණු ආසියාතික කලාපයේ වෙළඳ කටයුතු ලිහිල්කරණය සම්බන්ධයෙන් පුරෝගාමීත්වය දැරිය. 1989 ආරම්භයේ සිට ශ්‍රී ලංකාව ආනයනික බදු සම්බන්ධයෙන් ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ආනයන බදු සීඝ්‍ර ලෙස පහත හෙළන ලදී. 2001 වන විට ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ආනයන බදු අනුපාතය 9.1% ක් පමණ වූ අතර එය ආසියාතික කලාපයේ අනෙකුත් ප්‍රබලයන් හා සන්සන්දනයේදී,එනම් ඉන්දියාවේ 32% හා පාකිස්තානයේ 20% ක් යන අනුපාතයන්ට සාපේක්ෂව ඉතා අඩු අගයක් ගන්නා ලදී.

ශ්‍රී ලංකාව දකුණු ආසියාතික කලාපය තුළ නිදහස් වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් පෙරටුගාමීව කටයුතු කරන ලදී. වර්ෂ 2000 දී ක්‍රියාත්මක වූ ඉන්දු-ලංකා නිදහස් වෙළඳ ගිවිසුම මෙයට කදිම නිදසුනකි. ඒකාබද්ධ අධ්‍යයනයක් මගින් නිර්දේශිත පරිදි ඉන්දු - ශ්‍රී ලංකා පුළුල් ආර්ථික සහයෝගිතා ගිවිසුමට (CEPA) අදාළව 2004 දී අත්සන් කළේ නම්, ශ්‍රී ලංකාව දකුණු ආසියාතික කලාපයේ සේවා හා ආයෝජන සම්බන්ධ වෙළඳ ගිවිසුම්හිද පුරෝගාමියා වීමට ඉඩ තිබුණි. ශ්‍රී ලංකාව විදේශ වෙළඳාම සම්බන්ධව ඉතා එඩිතර දුරදර්ශී පිළිවෙතක් අනුගමනය කරන බවක් මෙම වකවානුවෙහි පිළිබිඹු විය. මෙය ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ප්‍රතිපත්තියෙහි එඩිතර පියවරක් ලෙස සැළකූ ආර්ථික විශ්ලේෂකයන් ශ්‍රී ලංකාව නිදහස් වෙළඳාමෙහි පතිඵල භුක්ති විඳින රටක් ලෙස පෙන්වා දෙන ලදී.

## ශ්‍රී ලංකාවේ වෙළඳ දිශානතියෙහි වෙනසක්.


වර්තමානයේ ශ්‍රී ලංකාව නිදහස් වෙළඳාම සම්බන්ධව පෙර තිබූ ගමන් මාර්ගයෙන් වෙනත් ඉසව්වකට පියමනින ආකාරයක් පෙන්නුම් කොට ඇත. ශ්‍රී ලංකාව තවමත් අනෙකුත් දකුණු ආසියාතික රටවලට සාපේක්ෂව අඩුම "සාමාන්‍ය ආනයනික බදු අනුපාතය" පවත්වාගෙන යනමුත් ආනයන සම්බන්ධව ක්‍රියාත්මක ආරක්ෂණවාදී ප්‍රතිපත්තියෙහි ක්‍රමානුකූල දැඩිබවක් දක්නට ඇත. එමෙන්ම විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, වරාය සහ තොටුපොළ බද්ද සහ ආනයන මත සෙස් බද්ද වැනි විවිධාකාර බදු අවිධිමත් ලෙස පසුගිය දශකය පුරාවටම ආනයන වෙළඳාම මත පැනවීමේ ප්‍රවණතාවයක්ද දක්නට ලැබුණි.

ශ්‍රී ලංකාව සහ අනෙකුත් දකුණු ආසියාතික රටවල් අතර තිබූ ආනයන බදු පරතරය ක්‍රමයෙන් අඩු වෙමින් පවතින නැමියාවක් වර්තමානයේ දක්නට පවතියි. 2011 ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ආනයන බද්ද 10.2% ක් (මෙම බදු ප්‍රතිශතය 2001 දී තිබූ ප්‍රතිශතයට වඩා වැඩි අගයක් ගනී) පමණ වූ අතර ඉන්දියාවේ සහ පාකිස්තානයේ මෙය පිළිවෙළින් 12.6% ක් සහ 13.9% ක අගයක් ගන්නා ලදී.

ශ්‍රී ලංකාව පසුගිය දශකය පුරාවටම විවිධ ආසියාතික රටවල් සමග නිදහස් වෙළඳ ගිවිසුම් ඇති කරගත් නමුත් එහි නියම ඵල නෙලාගැනීමට ශ්‍රී ලංකාව තවමත් අපොහොසත් වී ඇත. මෙම තත්වය ඉතා විෂම මෙන්ම වෙළඳ කටයුතු සම්බන්ධව ගැටළුකාරී ඉසව්වක ශ්‍රී ලංකාව පසුවෙන බවට ඉඟියකි.

**ගෝලීය මහා වෙළඳ සාප්පය ආසියාවට පැමිණෙයි.**

**2013 ආරම්භ වන විට ලෝක වෙළඳ සංවිධානයේ නීති හා රෙගුලාසි මත පදනම් වූ වෙළඳ ගිවිසුම් 546 ක් පමණ පැවති බවට සඳහන් වන අතර ඉන් 354 ක් ක්‍රියාත්මක මට්ටමේ හා 150 ක් සාකච්ඡා මට්ටමේ පැවතුනි. පසුගිය දශකය පුරාවටම හඳුන්වාදුන් වෙළඳ ගිවිසුම් 100 කට අධික සංඛ්‍යාවක් වර්තමානයේදී ක්‍රියාත්මක මට්ටමේ පසුවන අතර තවත් 150 ක් පමණ ගිවිසුම් මට්ටමේ පවතී. මේ ආකාරයෙන් බලන කල්හි ආසියාතික කලාපය වර්තමානයේ ලෝකයේ පවතින වෙළඳ ගිවිසුම් වලින් අඩකට පමණ පාර්ශවකරුවෙක් වී ඇත (රූප සටහන 2).**




**මෑත කාලයේ ආසියතික වෙළඳ ගිවිසුම් වේගයෙන් ප්‍රගුණනය වීමට බලපෑ ප්‍රධාන කරුණ නම් ආසියාතික කලාපයේ සිදුවෙමින් පවතින සීඝ්‍ර ආර්ථික වර්ධනයයි.**

**ආර්ථික වර්ධනයත් සමග කලාපීය වෙළඳපොළ ප්‍රසාරණය වීමට ආසියාතික රටවල් එකිනෙකා සමග කරණ වෙළඳාමෙහි වර්ධනයත් දියුණු රටවල් ආසියානු වෙළඳපොළට ඇතුලත් වීමට උත්සාහ දැරීමත් හේතු විය. මෙවන් වාතාවරණයක් තුළ ආසියාතික රටවල් හා දියුණු රටවල් අතර ලෝක වෙළඳාම තුළ වූ පරතරය ඉතා සීඝ්‍රයෙන් පටු වෙමින් පවතියි. 2012 දී ලෝක වෙළඳාමෙන් 1/4 ක පමණ පරිමාවක් තමන් නතුකර ගැනීමට ආසියාතික රටවල් 6 ක සංයුතියක් සමත්විය (රූප සටහන 1).**


| **අංක සටහන 01 : සමස්ත ලෝක වෙළඳාමට දායකත්වය (%) 2012** | | |
|---|---|---|
| | **අපනයන** | **ආනයන** |
| **චීනය** | 11.2 | 9.8 |
| **ජපානය** | 4.4 | 4.8 |
| **කොරියාව** | 3 | 2.8 |
| **හොංකොං** | 2.7 | 3 |
| **සිංගප්පූරුව** | 2.2 | 2 |
| **ඉන්දියාව** | 1.6 | 2.6 |
| **එකතුව** | 25.1 | 25 |

**මූලාශ්‍රය : ලෝක වෙළඳ සංවිධානය**

<u>**ශ්‍රී ලංකාව ගෝලීය තේ සාදයේදී හුදකලා වේ.**</u>

ආරම්භක අවධියේ දී ආසියාතික වෙළඳාම තුළ පෙරටුගාමීව කටයුතු කළ ශ්‍රී ලංකාව වර්තමානයේ දී සීඝ්‍ර පසුබෑමකට ලක්ව ඇත. අද වන විට ශ්‍රී ලංකාව වෙළඳාම අතින් දකුණු ආසියාතික කලාපයේ ඉහළින් සිටින්නේ අවම සංවර්ධිත රටවලට සාපේක්ෂව පමණි (රූප රාමුව 1).

2005 සිට ඉන්දියාව ආසියාකරයේ ප්‍රමුඛ රටවල් වන සිංගප්පූරුව, දකුණු කොරියාව, ජපානය, මැලේසියාව සහ ගිනිකොණදිග ආසියාතික රටවල් සමග පුළුල් ආර්ථික සහයෝගිතා ගිවිසුම් ඇති කරගෙන ඇත. සමස්තයක් ලෙස බලන කල ඉන්දියාව 2005 සිට වෙළඳ ගිවිසුම් 13 ක් පමණ ක්‍රියාකාරී මට්ටමට රැගෙන විත් ඇති අතර තවත් 21 ක් පමණ දැනට ගිවිසුම් මට්ටමේ පවතී. මේ අතරින් තවමත් නියමිත කාල රාමුවක් නොමැතිව අකර්මන්‍ය තත්වයේ පසුවන්නේ ඉන්දු - ශ්‍රී ලංකා පුළුල් ආර්ථික සහයෝගිතා (CEPA) ගිවිසුම පමණි.




**මූලාශ්‍රය: ආසියානු සංවර්ධන බැංකුව**

ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ ක්‍රියාත්මක වෙළඳ ගිවිසුම් 05 ක් පවතින අතර තවත් වෙළඳ ගිවිසුම් 03 ක් ගිවිසුම් මට්ටමේ පවතියි. මෙම සියළු ගිවිසුම් ආසියාතික රටවල් සමග පවත්වන අතර මෙහිදී කැපී පෙනෙන ප්‍රධාන කරුණ වන්නේ මෙම ගිවිසුම් තුළින් ශ්‍රී ලංකාව පාර්ශවකාර රටවලට (ඉන්දියාව හැර) සිදුකරන අපනයන ප්‍රතිශතය ඉතා කුඩා අගයක් ගැනීමයි. (අංක සටහන 02) උදාහරණයක් ලෙස පාකිස්තානය, බංගලාදේශය, මාලදිවයින, දකුණු කොරියාව සහ චීනය යන රටවලට සිදුකරන අපනයන පිළිවෙළින් 0.8%, 0.6%,0.5% සහ 1.2% වැනි ඉතා කුඩා අගයක් ගන්නා ලදි.

| අංක සටහන 02 : ශ්‍රී ලංකාවේ වෙළඳ ගිවිසුම් | | | |
|---|---|---|---|
| වෙළඳ ගිවිසුම් | වර්ෂය | වර්තමාන තත්වය | සාමාජික රටවල් |
| ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA) | 1976 | ක්‍රියාත්මක | ශ්‍රී ලංකාව, බංගලාදේශය, චීනය, ඉන්දියාව, දකුණු කොරියාව සහ ලාඕසය |
| දියුණු වෙමින් පවතින රටවල් අතර ගෝලීය වෙළඳ වරණ පද්ධතිය (GSTP) | 1988 | ක්‍රියාත්මක | සංවර්ධනය වෙමින් පවතින රටවල් 48 ක් |
| ඉන්දු - ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (India – Sri Lanka FTA) | 2000 | ක්‍රියාත්මක | ශ්‍රී ලංකාව සහ ඉන්දියාව |
| පාකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (Pakistan – Sri Lanka FTA) | 2005 | ක්‍රියාත්මක | ශ්‍රී ලංකාව සහ පාකිස්තානය |
| ඉන්දු - ශ්‍රී ලංකා පුළුල් ආර්ථික සහයෝගිතා ගිවිසුම (CEPA) | 2002 | උපදේශන සහ අධ්‍යයන මට්ටමේ | ශ්‍රී ලංකාව සහ ඉන්දියාව |
| බහු ආංශික තාක්‍ෂණික සහ ආර්ථික සහයෝගිතාවය උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වයට අදාළ නිදහස් වෙළඳ ගිවිසුම (BIMSTEC FTA) | 2004 | ගිවිසුම මට්ටමේ | ශ්‍රී ලංකාව, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය සහ තායිලන්තය |
| දකුණු ආසියාතික නිදහස් වෙළඳ කලාපය (South Asian Free Trade Area) | 2006 | ක්‍රියාත්මක | ශ්‍රී ලංකාව, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, ඇෆ්ගනිස්තානය සහ පාකිස්තානය |
| දකුණු ආසියානු සහයෝගිතා කලාපීය රටවල් අතර සේවා පිළිබඳ වෙළඳ ගිවිසුම (SAARC Agreement on Trade in Services) | 2010 | ගිවිසුමේ රාමුව පිළිබඳ එකගතාවයකට පැමිණ ඇත | ශ්‍රී ලංකාව, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, ඇෆ්ගනිස්තානය සහ පාකිස්තානය |

මෙවැනි රාමුවක් තුළ ශ්‍රී ලංකාව ගෝලීය වෙළඳාමෙහි විශෙෂයෙන්ම ආසියාතික වෙළඳාම තුළ පසුබට වී ඇති ආකාරයක් දක්නට ඇත. මීට බලපාන ප්‍රධාන සාධකය වන්නේ ශ්‍රී ලංකාව ආසියාතික රටවලින් ඉතා අධික ප්‍රමාණයන්ගෙන් ආනයනයන් සිදු කිරීමත් ඊට සාපේක්‍ෂව කරන අපනයන ප්‍රමාණයන් ඉතා අඩු අගයක් ගැනීමත්ය (අංක සටහන 3).

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන හවුල්කරුවන් 10 න් 8 ක්ම ආසියාතික රටවල් වන අතර එය ශ්‍රී ලංකාවේ මුළු ආනයන වලින් 57%කට පමණ හිමිකම් කියයි. එනමුත් ශ්‍රී ලංකාව මෙම රටවලට 2012

දී අපයනයන කොට ඇත්තේ 13% ක පමණ ඉතා සුළු අපනයන ප්‍රතිශතයක් පමණි. මෙම රටවල් සමග ගනුදෙනු කිරීමෙන් පමණක් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයෙහි වෙළඳ ගිණුමේ 2012 තුළ ඇතිවූ වෙළඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන 10 ක් පමණ ඉහළ අගයක් ගන්නා ලදී.

අංක සටහන 03: ආසියාතික වෙළඳාමට දායකත්වය - 2012

| Country | මුලු අපනයන වල % ලෙස | මුලු ආනයන වල % ලෙස |
|---|---:|---:|
| ඉන්දියාව | 19% | 5.8% |
| චීනය | 13.9% | 1.2% |
| සිංගප්පූරුව | 8.8% | 1.0% |
| මැලේසියාව | 4.2% | 0.7% |
| හොංකොං | 3.2% | 1.1% |
| ජපානය | 2.9% | 2.2% |
| දකුණු කොරියාව | 2.8% | 0.5% |
| තායිලන්තය | 2.4% | 0.9% |
| එකතුව | **57%** | **13%** |

මූලාශ්‍රය:ශ්‍රී ලංකා මහ බැංකුව

<u>ශ්‍රී ලංකාව විදේශ වෙළඳාමෙන් පාඩු ලබන්නේ ඇයි?</u>

ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක (ඉන්දු - ලංකා වෙළඳ ගිවිසුම හැර) වෙළඳ ගිවිසුම් නිසි ප්‍රතිඵල ගෙන නොදීමට බලපාන ප්‍රධාන සාධක දෙකකි. පළමු සාධකය නම් වෙළඳ සහන සම්බන්ධව ඇති අඩු ආවරණය සහ සීමිත ගැඹුරයි. ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුමට චීනය, දකුණු කොරියාව සහ ඉන්දියාව වැනි ප්‍රබල ආසියාතික රටවල් 3 ක් ම වෙළඳ පාර්ශවකරුවන් වුවද එමගින් පුළුල් භාණ්ඩ රැසක් සඳහා ආවරණය ලැබී නොමැති අතර වරණීය සීමාවද ඉතා පටුය.

ධීඹඡ හෙවත් ''දියුණුවෙමින් පවතින රටවල් අතර ගෝලීය වෙළඳ වරණ පද්ධතිය'' යන වෙළඳ ගිවිසුම ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුමටත් වඩා භාණ්ඩ ආවරණය සහ වෙළඳ සහන සම්බන්ධයෙන් දැඩි සීමා වලට යටත් වේ. එමෙන්ම දකුණු ආසියාතික නිදහස් වෙළඳ ගිවිසුම ්ඍඹ* අවම සංවර්ධිත රටවලට ක්‍රමිකව වෙළඳ බදු ඉවත්කිරීම සඳහා අදියර වශයෙන් බලපවත්වන දීර්ඝකාලීන ක්‍රමවේදයක් ද ඉතා විශාල ප්‍රතිශේධ භාණ්ඩ (වෙළඳ ගිවිසුම මගින් ආවරණය නොවන භාණ්ඩ) ලැයිස්තුවක් ද ඇතුළත් වේ.

දෙවන සාධකය නම් ශ්‍රී ලංකාව දැනට ක්‍රියාකාරීව සහභාගී වන සෑම වෙළඳ ගිවිසුමක් ම භාණ්ඩ වෙළඳාමට පමණක් සීමා වී තිබීමයි. වර්තමානයේ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් එළඹෙන සෑම වෙළඳ ගිවිසුමක් ම භාණ්ඩ වෙළඳාම නැමති පටු සීමාවෙන් ඔබ්බට ගොස් සේවා, ආයෝජන, බුද්ධිමය දේපළ සහ තරගකාරීත්වය වැනි ඉතා ආකර්ෂණීය අංශ රැසක් වෙළඳ ගිවිසුම් මගින් ආවරණය කිරීමට උත්සුක වේ. මේ වන විට ලෝක වෙළඳ සංගමයට දැනුම් දී ඇති ආකරයට වෙළඳ ගිවිසුම් 117 ක් පමණ භාණ්ඩ හා සේවා වෙළඳාම යන අංශ දෙකම වෙළඳ ගිවිසුම් මගින් ආවරණය කොට ඇත.

**මෙය විදේශ වෙළඳාම පිළිබඳව නැවතත් ගැඹුරින් සිතා බැලීමට කාලයයි.**

**වෙළඳාම ලිහිල්කරණයට ඉඩ නොදීමට බොහෝ සාධාරණ හේතු සාධක ඇත. සංවේදී කෘෂිකාර්මික අංශයන් හා ළදරු කර්මාන්ත වලට ආරක්ෂණය ලබාදීම වැනි කරුණු සම්බන්ධව ආරක්ෂණකාරී වෙළඳ ප්‍රතිපත්තියක් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එනමුදු ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තියෙහි සිදුවන දිශානතියෙහි වෙනස මගින් මේ ආකාරයේ ශ්‍රී ලාංකික කර්මාන්ත ක්ෂේත්‍රයට ධනාත්මක දායකත්වයක් ලබාදෙන බවක් දක්නට නොමැත. ශ්‍රී ලංකාව ආසියාතික වෙළඳාමෙහි ප්‍රමුඛ ස්ථානයක සිට වර්තමානය වන විට ඉතා උදාසීන පසුගාමී තත්ත්වයකට පත්ව ඇත. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර වෙළඳ ගනුදෙනු දෙස බැලීමේදී ඉන්දියාවේ සිදු කරන ආනයන වලට සාපේක්ෂව ශ්‍රී ලංකාව සිදුකරන අපනයන පවතින්නේ ඉතා සුළු මට්ටමකය. මෙම කරුණු සැලකිල්ලට භාජනය කිරීමේදී පෙනී යන්නේ "ශ්‍රී ලංකාවේ වෙළඳ දිශානතිය කොයිබටද? එහි ප්‍රතිලාභ මොනවාද?" යනාදී ප්‍රශ්නාර්ථ රැසක් තුළ අප සිර වී ඇති බවයි. දත්ත විශ්ලේෂණයේදී හඬගා කියවෙන අවධානයට යොමුවන ප්‍රධාන කරුණ වන්නේ මෙය ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම නැවතත් ගැඹුරින් හා බුද්ධිමත්ව සිතා බැලීමට කාලය බවයි.**

වෙරිටේ රිසර්ච් යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.